## 17. අධිකරණය විසින් නියම කරනු ලැබ දකුණු පළාතේ 1990 අංක 01 දරණ මුදල් ප්‍රඥප්තිය යටතේ අයකර ගත් දඩ සහ දන්ඩණ මුදල් දකුණු පළාතේ පළාත් පාලන ආයතනවලට පැවරීමට විධිවිධාන සැලැස්වීම සඳහා වූ ප්‍රඥප්තියකි.

දකුණු පළාතේ පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ:-

**01.** මේ ප්‍රඥප්තිය දකුණු පළාතේ 1994 අංක: 05 දරණ අධිකරණ දඩ පැවරීමේ ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලැබේ. *(ලුහුඬු නාමය)*

**02**. සංශෝධිත පරිදි වූ දකුණු පළාතේ 1990 අංක 07 දරණ මුදල් ප්‍රඥප්තිය අනුව පළාත් සභාව විසින්, පළාතේ පිහිටා ඇති අධිකරණය විසින් නියම කරන ලද දඩ හා දන්ඩණ මුදල් අයකර ගෙන ඇති අවස්ථාවක, ඉහත කී පරිදි එම දඩ හෝ දන්ඩණ මුදල් අයකරගත් වර්ෂයේ දෙසැම්බර් මාසයේ තිස් එක් වන දිනයේ සිට අවුරුදු දෙකක කාලයක් ඇතුළත, අදාළ පළාත් පාලන ආයතනයේ ප්‍රධාන පරිපාලන නිලධරයා විසින් ලිඛිතව පළාතේ මුදල් විෂයය භාර අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරයා වෙත කරනු ලබන ඉල්ලීමක් මත, පළාත් සභාව විසින් එම දඩ හෝ දන්ඩණ මුදල අදාළ පළාත් පාලන ආයතනයට පැවරිය හැකිය. *(අධිකරණය දඩ හා දන්ඩණ මුදල් පැවරීම.)*

**03**. 2 වන වගන්තිය යටතේ වූ කිසිම ඉල්ලීමක් එම දඩ හෝ දන්ඩණ මුදල් ගෙවූ දිනය, එම මුදල් අදාල අධිකරණය විසින් පළාත් සභාවට ප්‍රේෂණය කළ දිනය සහ එම දඩ හෝ දන්ඩණ මුදල නියම කළේ කවර ආඥාපනතක් හෝ පනතක් යටතේද යන වග, එහි උපලේඛනයට විශේෂ යොමු කිරීමක් සහිතවද එම දඩ හෝ දන්ඩණ මුදල් නියම කර අයකරගත් අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා විසින් හෝ ඔහු විසින් තත් කාර්යය සඳහා නම්කල වෙනත් යම් නිලධරයකු විසින් සහතික කරනු ලැබ ඇත්නම් මිස, එවැනි ඉල්ලීමක් වලංගු නොවිය යුතුය. *(අධිකරණයේ රෙජිස්ට්‍රාර් වරයාගේ සහතිකය.)*

**04**. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මේ ප්‍රඥප්තියෙහි,“ප්‍රධාන පරිපාලන නිලධරයා“ යන්නෙන් *(අර්ථ නිරූපණය)*

(අ) මහ නගර සභාවක් සම්බන්ධයෙන් වූ විට, මහ නගර සභා කොමසාරිස්වරයා ද,

(ආ) නගර සභාවක් හෝ ප්‍රාදේශීය සභාවක් සම්බන්ධයෙන් වූ විට එහි ලේකම්වරයාද අදහස් වෙයි.



"පළාත් පාලන ආයතනය" යන්නෙන් යම් මහ නගර සභාවක්, නගර සභාවක් හෝ ප්‍රාදේශීය සභාවක් අදහස් වන අතර ඒ යම් සභාවක් විසින් ක්‍රියාත්මක කරන හා ඉටු කරන බලතල, කාර්ය සහ කර්තව්‍යවලට අනුරූප වන්නා වූ හෝ සමාන වන්නා වූ බලතල කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම සඳහා යම්කිසි නීතියකින් හෝ නීතියක් යටතේ හෝ ඇතිකොට පිහිටුවන ලද කවර වූ හෝ අධිකාරයක් ඊට ඇතුළත් වේ.
"පළාත" යන්නෙන්, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ දකුණු පළාත අදහස් වේ.
“පළාත් සභාව“ යන්නෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ දකුණු පළාතේ පළාත් සභාව අදහස් වේ.

**05**. මේ ප්‍රඥප්තියේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතුය. *(අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු බව)*